## " ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ සේවා"
## ගණය සඳහා  බඳවා ගැනීමේ පරිපාටිය (ආදර්ශය)

## බඳවා ගැනීමේ පරිපාටියට අදාළ අනිවාර්ය තොරතුරු ඇතුළත් ආකෘතිය
---------------------------------------------------------------------------------

**ආයතනයේ ලිපි ගොනු අංකය :** **දිනය :**

**කළමනාකරණ සේවා ලිපි ගොනු අංකය :** **දිනය :**

1. **සේවා ගණය**

 1.1 ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ සේවාවන්

2. (අ) **සේවා ගණයට පැවරෙන කාර්යයන්හි ස්වභාවය පිළිබඳ පොදු නිර්වචනය**

 ආයතනය සංස්ථාපනය කෙරෙණ පණත මගින් ආයතනය වෙත පැවරෙන විද්‍යාත්මක පර්යේෂණ හා අධ්‍යයන කාර්යයන් අතුරින් පත්වීම් බලධාරියා විසින් සුවිශේෂී කොට පවරා දෙනු ලබන විෂයයන්  පැවරෙන ජ්‍යෙෂ්ඨ නිලධාරීහු මෙම සේවා ගණයට අයත් වෙති.

 (ආ) **තනතුරු නාමය** (අනුමත කරනු ලැබ ඇති තනතුරු නාමයන් සඳහන් කරන්න.)

 (ඇ) **තනතුරට පැවරෙන කාර්යයන්**

 (ආයතනික අවශ්‍යතාවයන් පදනම් කොට ඒ ඒ තනතුරට පැවරෙන කාර්ය භාරය සඳහන් කරන්න.)

3. **පත්වීමේ ස්වභාවය සඳහන් කරන්න.**

 (ස්ථිර, සේවක අර්ථසාධක අරමුදල / සේවාදායකයින්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම්  සහිත / රහිත ආදී වශයෙන්)

4. **වැටුප් ක්‍රමය**

 4.1 සේවා ගණයට අදාළ වැටුප් කේත අංකය හා මාසික වැටුප් පරිමාණය :

 <u>2006.01.01 දින සිට</u>

 A.R. 2-2006   - රු. 34,045-10x925-43,295

 <u>2006.01.01 දින සිට</u>

 A.R. 2-2006 A   - රු. 34,550-10x925-43,880

 (සෑම පත්වීම් ලිපියකම වැටුප් කේත අංකය, වැටුප් පරිමාණය හා ශ්‍රේණි ව්‍යුහය සම්පූර්ණයෙන්ම සඳහන් කළ යුතුය.

 4.2 **සේවක සංඛ්‍යාව**

 අනුමත කරනු ලැබ ඇති පරිදි හෝ වාර්ෂික ඇස්තමේන්තු වල දැක්වෙන පරිදි සේවා ගණයට අයත් සේවක සංඛ්‍යාව, මෙමගින් අදහස් කෙරේ. (ඒ අනුව සේවක සංඛ්‍යාව නිශ්චිතව සඳහන් කළ යුතු වේ.)

4.3 රජය විසින් කලින් කල තීරණය කරණු ලබන පරිදි අවශ්‍ය වන ප්‍රවීණතා හා නිපුණතාවන් ද සියලුම සේවකයින් විසින් නියමිත පරිදි ලබා ගත යුතු වේ.

## 5. " ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ සේවා" ගණයට බඳවාගැනීම

**බඳවාගැනීමේ ක්‍රමය**

බඳවාගැනීමේ පරිපාටියේ නිශ්චිතව සඳහන් කරනු ලබන පරිදි ප්‍රසිද්ධ දැන්වීම් පළ කිරීම මගින් ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු වැඩිම සුදුසුකම් ලද්දවුන් කැඳවා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තොරාගනු ලැබේ. තෝරාගැනීම හුදෙක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත සිදු කෙරේ.

**සුදුසුකම් (උදාහරණය)**

**බාහිර අයදුම්කරුවන්**

5.1 **අධ්‍යාපන**

(අ) i. පළමු පන්තිය හෝ දෙවන පන්තිය (ඉහළ) සාමාර්ථයක් සහිතව නියමිත විෂයයන් සම්බන්ධ උපාධියක් ලබා තිබීම.

හෝ

ii. නියමිත විෂයයන් සම්බන්ධව දෙවන පන්තිය (පහළ) සාමාර්ථයක් සහිත සිව් අවුරුදු විශේෂ උපාධියක් සමග උපාධිය ලබාගැනිමෙන් පසු එක් වසරක අදාළ ක්ෂේත්‍රයෙහි පළපුරුද්ද

හෝ

iii. නියමිත විෂයයන් සම්බන්ධ උපාධියක් සමග දැවුරුදු පර්යේෂණ පශ්චාත් උපාධියක් ලබා තිබීම

සමග

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් හා ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු වසර අට (08) ක පර්යේෂණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද

(අදාල විෂයයන් කවරේදැ යි නිශ්චිතව සඳහන් කරන්න.)

(ආ) **වෙනත් සුදුසුකම්**

අදාළ ක්ෂේත්‍රයෙහි පර්යේෂණ නිබන්ධනයන් අතිරේක සුදුසුකමක් වනු ඇත. තනතුරට පැවරෙන කාර්යයන්හි ස්වභාවය අනුව අවශ්‍ය වන වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද වෙනත් සුදුසුකම් (අවශ්‍ය සුදුසුකම් නිශ්චිතව සඳහන් කරන්න.)

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක් සමග අධ්‍යයන / පර්යේෂණ සේවා ගණයෙහි වසර අට (08) ක පළපුරුද්ද

හෝ

අදාළ ක්ෂේත්‍රයේ දර්ශනපති, විද්‍යාපති උපාධි සුදුසුකම් සහිතව අධ්‍යයන / පර්යේෂණ සේවා ගණයෙහි වසර දහය (10) ක පළපුරුද්ද

5.2 **වයස**

අවු : 22 ට නො අඩු හා අවු : 55 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවනට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

5.3 **වෙනත්**

සෑම බඳවා ගැනීමක් සම්බන්ධයෙන්ම ආයතනික කාර්ය පරිපාටි සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

5.4 මෙම සේවා ගණයට සිදු කරනු ලබන සියලුම පත් කිරීම් / බඳවාගැනීම් මෙම පරිපාටියෙහි විධිවිධානයනට තරයේ අනුකූල වන පරිදි පමණක් විය යුතුය.

5.5 **ස්ථිර කිරීම**

සේවයට පත් කරනු ලබන නිලධාරියෙකු තුන් වසරක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, ඔහු / ඇය පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ / තනතුරේ ස්ථිර කරනු ලැබේ. අභ්‍යන්තර අයදුම්කරුවන් අතරින් තෝරාගනු ලබන දැනටම ආයතනයේ කිසියම් තනතුරක ස්ථිර කරනු ලැබ ඇති අය වැඩබැලීමේ කාලපරිච්ඡේදයකට යටත්ව බඳවාගනු ලැබිය හැකිය.

5.6 **බඳවාගැනීමේ දී වැටුප**

බාහිර අයදුම්කරුවන් අතුරින් බඳවාගැනීමේ දී අදාළ තැනැත්තා වැටුප් පරිමාණයේ ආරම්භක පියවරෙහි පිහිටුවනු ලැබිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවාගැනීමේ දී පිහිටුවනු ලැබිය යුතු වැටුප් පියවර ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ විධිවිධාන පරිදි සිදු කරණු ලැබේ.

## 6. සේවයේ යෙදී සිටින්නන් අන්තර්ග්‍රහණය කිරීම (නියමිත දිනට සේවයේ යෙදී සිටිනන්නන්ට පමණක් අදාළ වේ.)

නව බඳවාගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට කළමනාකරණ සේවා චක්‍රලේක අංක. 30 මගින් ලබා දී ඇති A.R. 2 වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන සේවකයින් සියලුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4 වගන්තියේ විධිවිධානවලට යටත්ව සෙවා ගණයට අන්තර්ග්‍රහණය කරණු ලැබේ. සේවා කාලය ගණන් ගත යුත්තේ ඒ ඒ තනතුරට පත් කරන ලද දිනය පදනම් කර

ගෙනය. අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර, එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවැති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේ දී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබිම ද සිදු නොකළ යුතුය.

7. **අර්ථ නිරූපණ**

7.1 **"සතුටුදායදක සේවා කාලය"** යනුවෙන් අදහස් කරනුයේ උසස්වීම් සඳහා ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න සේවා කාලය තුළ යෙදුණු සියලුම වැටුප් වර්ධක ලබා ඇත්තා වූද, ඒ කාලය තුළ කල වරදකට (අවවාද කිරීමක් හෝ තදින් අවවාද කිරීමක් හැර) දඬුවමක් ලබා නැත්තා වූද, සේවා කාලයකි.

7.2 **පත්වීම් බලධාරියා**

(පත්වීම් බලධාරියා කවුරුන්දැ යි නිශ්චිතව සඳහන් කරන්න.)

(බඳවාගැනීමේ පරිපාටියේ අවශ්‍යතා සඳහා භාවිත යෙදුම් පිළිබඳ අවශ්‍ය වන පරිදි අර්ථ නිරූපණ සපයන්න)

අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

ආයතන ප්‍රධානියාගේ අත්සන දිනය :
(නිල මුද්‍රාව)

නිර්දේශය කරමි

රේඛීය අමාත්‍යාංශයේ ලේකම් ගේ අත්සන දිනය :
(නිල මුද්‍රාව)

අනුමත කරමි.

කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් දිනය :
(නිල මුද්‍රාව)